**චීන සංවර්ධන බැංකුව විසින් මූල්‍යයනය කෙරෙන ප්‍රමුඛතා මාර්ග 3 (අදියර II) ව්‍යාපෘතිය - 2018**

---

චීන සංවර්ධන බැංකුව විසින් මූල්‍යයනය කෙරෙන ප්‍රමුඛතා මාර්ග 3 (අදියර II) ව්‍යාපෘතියේ 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ චීන සංවර්ධන බැංකු සංස්ථාව අතර 2014 නොවැම්බර් 24 දින එළඹි අංක 4510201401100000587 දරන ණය ගිවිසුම සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුලත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුවට වාර්තා කල යුතු යැයි මා සලකන මාගේ අදහස් හා නිරීක්ෂණ මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා කාලය

---

ව්‍යාපෘතියේ ණය ගිවිසුම අනුව, එවකට වරාය හා මහා මාර්ග අමාත්‍යාංශය වර්තමානයේ මාර්ග හා මහාමාර්ග අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිත ආයතනය වන අතර, මාර්ග සංවර්ධන අධිකාරිය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිත ආයතනය වේ. ව්‍යාපෘතියේ අරමුණු වන්නේ, මධ්‍යම, නැගෙනහිර, සබරගමුව, බස්නාහිර සහ වයඹ පළාත්වල මාර්ග කොටස් 09 ක කිලෝමීටර් 131.50 ක් පුනරුත්ථාපනය හා සංවර්ධනය කිරීමයි. ණය ගිවිසුම අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 10,628 කට සමාන එ.ජ.ඩො.මිලියන 81.75 ක් වන අතර ඉන් රු.මිලියන 7,800 කට සමාන එ.ජ.ඩො.මිලියන 60 ක් මූල්‍යයනය සඳහා සවුදි සංවර්ධන අරමුදල එකඟ වී තිබුණි. ව්‍යාපෘතිය විසින් එහි කටයුතු 2013 ජූනි 03 වන දින ආරම්භ කර තිබූ අතර 2018 දෙසැම්බර් 31 වන විට නිම කිරීමට සැලසුම් කර තිබුණි.

## 1.3 මතය

---

මේ සමඟ ඉදිරිපත් කර ඇති 2018 දෙසැම්බර් 31 දිනට වන මූල්‍ය ප්‍රකාශන මඟින් ව්‍යාපෘතියේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මුදල් ප්‍රවාහ ප්‍රකාශය ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිත වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.4 මතය සඳහා පදනම

---

මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් හා උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.5 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, ඊට සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍යා ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත්කිරීම මාගේ අරමුණවේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිත ප්‍රකාරව විගණනය සිදුකිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා හා වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය හා වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිත ප්‍රකාරව විගණනය කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍යා ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍යා ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතාන්විත මගහැරීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීමෙන් වංචාවක් ඇතිවීමට හේතු වන බැවිනි.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබාගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙලිදරව් කිරීම ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

# 2. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

## 2.1 නීතිරීති රෙගුලාසිවලට අනුකූල නොවීම

| අංකය | නීතිරීති රෙගුලාසි සඳහා යොමුව | අනුකූල නොවීම | බලපෑම් | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|---|---|
| (අ) | රාජ්‍ය මූල්‍ය චක්‍රලේඛය 5/2016 සහ මුදල් රෙගුලාසි අංක 756 | භාණ්ඩ සමීක්ෂණය සිදුකර නොතිබූ අතර සමීක්ෂණ වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. | අභ්‍යන්තර පාලන පද්ධතියේ දුර්වලතා | සියළුම සමීක්ෂණ තොරතුරු සහ ලැයිස්තු දැනට ව්‍යාපෘති කාර්යාලය මඟින් ලබාගත හැක. | චක්‍රලේඛ උපදෙස් අනුගමනය කල යුතුයි. |

| | | | | | |
|---|---|---|---|---|---|
| (ආ) | 2015 දෙසැම්බර් 29 දිනැති අංක 06/2015 දරන ජාතික අයවැය චක්‍රලේඛය | නිළධාරීන්ගේ ක්‍රියාකාරකම්වල නිමැවුම ඔවුන් වෙත පවරන ලද රාජකාරී අනුව හඳුනාගැනීම සඳහා ක්‍රියාකාරී සැලසුම් සකස් කර නොතිබුණි. තවද, 2018 වර්ෂය සඳහා ව්‍යාපෘති ක්‍රියාකාරකම් සුමට ලෙස ක්‍රියාත්මක කිරීම වෙනුවෙන් ප්‍රධාන කාර්යසාධන දර්ශක සහ නිශ්චයාත්මක මාර්ග සකස්කර නොතිබුණි. | අභ්‍යන්තර පාලන පද්ධතියේ දුර්වලතා | මාර්ග සංවර්ධන අධිකාරියේ සැලසුම් අංශයේ අවශ්‍යතාවය පරිදි සැලසුමේ ලේඛනගත ආකෘතිය කලින්කලට සංශෝධනය වී ඇත. ව්‍යාපෘතියේ ක්‍රියාකාරී සැලැස්ම, කාර්යසාධන දර්ශක සහ ලේඛනගත ප්‍රධාන සැලසුම මයික්‍රොසොෆ්ට් (MS) ව්‍යාපෘති මෘදුකාංගය භාවිතයෙන් අප විසින් සකසා ඇත. එමනිසා, නිශ්චයාත්මක මාර්ග සමඟ ප්‍රධාන කාර්යයන් ව්‍යාපෘති කාර්යාලය මඟින් ලබාගත හැක. | චක්‍රලේඛ උපදෙස් අනුගමනය කල යුතුයි. |
| (ඇ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි අංක 751 | ව්‍යාපෘති කළමනාකරණ ඒකකයට සහ ව්‍යාපෘති කාර්යාල වලට අදාල ස්ථාවර වත්කම් ලේඛන යාවත්කාලීන කර ව්‍යාපෘතිය විසින් නඩත්තු කර නොතිබුණි. | වත්කම් නැතිවීම් හඳුනාගැනීමේ අපහසුතාවය | 2018 දෙසැම්බර් 31 දිනට ක්ෂේත්‍ර කාර්යාල සහ පර්යේෂණාගාර සත්‍යාපනයන් සිදුකර ඇත. සියළුම සත්‍යාපන ලේඛන ව්‍යාපෘති අධ්‍යක්ෂ කාර්යාලය මඟින් ලබාගත හැක. | චක්‍රලේඛ උපදෙස් අනුගමනය කල යුතුයි. |

## 3. භෞතික කාර්යසාධනය

### 3.1 ව්‍යාපෘති ක්‍රියාකාරකම්වල භෞතික ප්‍රගතිය

| විගණන නිරීක්ෂණ | බලපෑම | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|
| ප්‍රාරම්භක සැලසුම අනුව ව්‍යාපෘති කාලය තුල, ජාතික මාර්ග 20 ක කිලෝමීටර් 128.10 ක් පුනරුත්ථාපන කටයුතු සිදුකිරීමට සැලසුම් කර තිබුණි. කෙසේ වුවත්, කාර්යසාධන වාර්තා අනුව 2018 ජනවාරි 01 දිනට ජාතික මාර්ග 20 න් 11 ක සියයට 80 ක් ඉක්මවා සහ මාර්ග 5 ක සියයට 75 ක් ඉක්මවා වැඩ නිමකර තිබුණි. මේ | ව්‍යාපෘතිය විසින් අනවශ්‍ය වියදම් දැරීමේ හැකියාව | 2017 වර්ෂය තුළදී සියයට 80 ක ප්‍රගතියක් ළඟා කරගෙන ඇත. ව්‍යාපෘතියේ කෙරීගෙන යන වැඩ සඳහා 2017 වර්ෂයේදී කාර්යමණ්ඩලය යොදවන ලදී. නමුත්, 2018 වර්ෂය ඉදිකිරීම් කටයුතුවල උච්චතම අවස්ථාව වූ අතර අනුමත කාර්යමණ්ඩලය අනුව ඉතිරි සියළුම කාර්යය මණ්ඩලය | ඉතිරි මාර්ග පුනරුත්ථාපන කටයුතු කඩිනම් කිරීම සඳහා ක්‍රියාමාර්ග ගත යුතුය. |

| | |
|---|---|
| සම්බන්ධයෙන් ව්‍යාපෘති කළමනාකරණ අංශයේ වියදම් රු.මිලියන 45 කින් හෝ පෙර වර්ෂය හා සැසඳීමේදී එය සියයට 81 ක් වූ අතර, වියදම් වැඩිවීම සඳහා හේතූන් විගණනය සඳහා ඉදිරිපත් නොවීය. | ව්‍යාපෘතියේ සේවයේ යෙදවීමට සිදුවිය. |

## 3.2 කොන්ත්‍රාත් පරිපාලනය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| අංකය | විගණන නිරීක්ෂණය | බලපෑම | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|---|
| ----- | -------------------- | ---------- | ---------------- | -------------- |
| (අ) | සාමාන්‍ය කොන්ත්‍රාත් කොන්දේසි උපවගන්ති 4.2 ප්‍රකාරව කොන්ත්‍රාත්තුවේ නිසි කාර්යසාධනයක් සඳහා කාර්යසාධන ඇපකරයක් කොන්ත්‍රාත්කරු තමන්ගේ වියදමින් ලබාගත යුතු වුවද, කොන්ත්‍රාත්කරු තම වියදමින් දරාගත යුතු කාර්යසාධන ඇපකරය සැපයීම සඳහා වන වියදම කොන්ත්‍රාත්කරු හට පියවාගැනීමට ඉඩදෙමින් වෙනමම වියදම් අයිතමයක් ප්‍රමාණ බිල්පතට ව්‍යාපෘතිය විසින් ඇතුළත් කර තිබූ බව නිරීක්ෂණය විය. ඒ අනුව, අයිතම අංක 108.1(1) යටතේ රු.මිලියන 15 ක් බාහිර ගෙවීමක් ලෙස කොන්ත්‍රාත්කරුවන්ට ගෙවා තිබුණි. | කොන්ත්‍රාත්කරුට අනිසි ප්‍රතිලාභ | මෙම අයිතමය ඇතුලත් නොකලේ නම් කොන්ත්‍රාත්කරු විසින් මෙම පිරිවැය අනෙකුත් රේට සඳහා ඇතුලත් කිරීම සහ ප්‍රතිඵලයක් ලෙස රේටයන් ඉහලයා හැකිය. එමනිසා, ප්‍රමානපත්‍රයේ වියදම් අයිතම 108.1(1) මඟින් ප්‍රතිපාදන සලසා ඇති ගෙවීමක් බාහිර ගෙවීමක් නොවේ. | වැඩිපුර ගෙවීම් අයකරගැනීමට ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ආ) | සමාජ හා පාරිසරික අනුකූලතා සහ ඉඩම් අත්පත් කරගැනීමේ කටයුතු සඳහා රු.65,000 ක මාසික වේතනයකට උපදේශකවරයෙකු මාර්ග සංවර්ධන අධිකාරිය විසින් යොදවා තිබුණි. 2018 ජූලි 31 වන විට රු. 447,500 ක් | අනවශ්‍ය කාර්යය මණ්ඩල යෙදවීම හේතුවෙන් පිරිවැය ඉහල යා හැකිවීම. | මෙම ව්‍යාපෘතියේ ඉඩම් අත්පත් කරගැනීමේ ක්‍රියාවලිය සලකා බලනු නොලැබේ. අදාල ඉඩම්හිමියන්ගේ ප්‍රධාන පදනම මත මාර්ග පුළුල් කිරීම සඳහා අමතර ඉඩම් ව්‍යාපෘතිය විසින් සලකා බලනු ලැබේ. මෙම අරමුණ සඳහා, පාර්ශව කීපයක් | අත්‍යාවශ්‍ය නොවන කාර්යමණ්ඩලය අඩුකිරීමට කටයුතු කල යුතුයි. |

උපදේශක සඳහා ගෙවා තිබුණද, සමාලෝචිත වර්ෂය තුල ඉඩම් අත්පත් කරගැනීමේ කටයුතු ව්‍යාපෘතිය විසින් සිදුකර නොතිබුණි.

සමඟ නිරන්තරයෙන් සාකච්ඡා කිරීමකට සිදුව තිබුණි. කොන්ත්‍රාත්තුව සඳහා යොදවන ලද උපදේශකයන් ඔවුන්ගේ දායකත්වය ලබාදුන් අතර ඉඩම් හිමියන්ගේ කැමැත්ත ලබාගැනීම සඳහා ප්‍රදේශයේ දේශපාලන අධිකාරිය සාධනීය ලෙස සම්බන්ධීකරණය කරන ලදී.